රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 6/91

රාජ්‍ය පරිපාලන, පලාත් සභා සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 07.
1991 පෙබරවාරි මස 23 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පලාත් ආණ්ඩුකාර ලේකම්වරුන්,
පලාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
දිසාපතිවරුන් වෙත.

## වැටුප් ණය - XXIV වැනි පරිච්ඡේදය ආයතන සංග්‍රහය.

11:2 වන උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පරිදි ආදේශ කළ මැනවි.

" 11:2 ණය ප්‍රමාණය - 11:13:8 වැනි උප වගන්තියට සහ 11:2:1 සහ 11:2:2 වගන්ති වලට යටත්ව ණය මුදල, නිලධාරියාගේ අවුරුදු පහක වැටුපට වැඩි නොවිය යුතුය."

02. 11:2:1 උප වගන්තියට පසුව ඊළඟට පහත සඳහන් අලුත් උප වගන්ති ඇතුළත් කළ මැන"

" 11:2:2 - ඉඩමක් හෝ නිවාස දේපලක් සම්බන්ධයෙන් අඩු කළයුතු මාසික ණය වාරිකය 3:5 උප වගන්තිය යටතේ දැක්වෙන අඩු කිරීම් සීමා තුළ තබාගන්නට නොහැකි අවස්ථාවලදී, එකී සීමාවන් මාසික වාරික තුළ තබාගත හැකි අඩුකළ ණය මුදලක් අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කළ හැකිය."

03. 3:5:1 උප වගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පරිදි ආදේශ කළ මැනවි.

" 3:5:1 ඉඩමක් හෝ නිවාස දේපලක් මිලදී ගැනීම සඳහා ණය මුදලක් ලබා ගන්නා නිලධාරියෙක් සම්බන්ධයෙන්, උපරිම අඩු කිරීම් මාසික වැටුපෙන් 50% කට සීමා විය යුතුය. මෙම සීමාව ඉක්මවා යාමට හේතු විය හැකි ප්‍රමාණයේ ණය මුදලක් අනුමත නොකළ යුතුය. කෙසේ වුවද 11:2:2 උප වගන්තිය යටතේ ණය මුදලක් අනුමත කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ලේකම්ට තීරණයක් ගත හැකිය."

04. 3:8 උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පරිදි ආදේශ කළ මැනවි.

" 3:8 (උත්සව අත්තිකාරම් සහ ඉඩමක් හෝ නිවාස දේපලක් පිළිබඳ ණය හැර)
සෑම ණය මුදලක් වෙනුවෙන්ම සියයට 7.2 (හතයි දශම දෙකයි) බැගින් පොලිය මාස්පතා අයකර ගත යුතු අතර, ඉඩමක් හෝ නිවාස දේපල ණය සඳහා පොලී ප්‍රමාණය වර්ෂයකට 12%ක් විය යුතුය."

05. භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කරන ලදී.

අ.කළේ./(ආර්. අබේරත්න)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පලාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.